**ශීර්ෂය 212 - විභාග දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

**---------------------------------------------------------------------------------------------**

ශීර්ෂය 212 - විභාග දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 14 දින විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම

**---------------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

**-------**

## 2.1 විසර්ජන ගිණුම

**-----------------**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

**---------------------------**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3.260.65 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 3.181.22 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 79.43 ක් හෙවත් සියයට 2.44 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 2,925.51 | 2,894.20 | 31.31 | 1.07 |
| මූලධන | 335.14 | 287.02 | 48.12 | 14.36 |
| **එකතුව** | **3,260.65** | **3181.22** | **79.43** | **2.44** |

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා අංක 20.03.02.13 දරන ආදායම් සංකේතය සඳහා එකතුව රු.මිලියන 300.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 392.16 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 130.72 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.03.02.13 | 300.00 | 392.16 | 92.16 | 30.72 |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 21201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 23.01 | 23.00 | 15.00 | 19.28 | 100.00 | 65.29 |

## 2.4 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ තැන්පත් ගිණුම් 03 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 1.34 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- |
| | රු.මිලියන |
| 6000/0000/00/0002/0105/000 | 0.28 |
| 6000/0000/00/0016/0053/000 | 0.87 |
| 6000/0000/00/0018/0115/000 | 0.19 |
| | ------ |
| **එකතුව** | **1.34** |
| | === |

## 2.5 විගණන නිරීක්ෂණය

විභාග දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සහා වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

### 3.2 ආදායම් ගිණුම

අංක 20.03.02.13 දරන අදායම් සංකේතයට අදාළව මුදල් රෙගුලාසි 128(2)(ආ) ප්‍රකාරව හිඟහිටි ආදායම් වාර්තා අර්ධ වාර්ෂිකව පිළියෙල කර එළඹෙන මාසය ඇතුළත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 21201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.982,030 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 03 කට වඩා වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

## 3.4 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) | මුදල් රෙගුලාසි 104 | 145,254 | අනතුරට පත් වූ වාහන 02 ක් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 396(ඇ) | 733,413 | නිකුත් කර තිබුණත්, බැංකුව වෙත වෙත ඉදිපත් නොවූ මාස 06 ක කාලය ඉක්මවූ චෙක්පත් 314 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| **(ආ)** | **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | |
| | 5.4.12 මාර්ගෝපදේශය | 45,581,355 | 2016 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණු සැපයීම් සඳහා එකතු කළ අගය මත බදු ගෙවා තිබුණි. එම බදු පිළිබඳ මාසික වාර්තා විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂය සහ ඉන්පසුව පැවැත්වෙන අ.පො.ස. (සා.පෙළ) විභාග සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහ සහ මූලාකෘති ප්‍රශ්න සකස් කිරීමේදී පාලි, ප්‍රංශ, ජපන් සහ අරාබි යන විෂයයන් වෙනුවෙන් එක් එක් විෂය පිළිබඳ විශේෂඥයින්ගේ දැනුම ලබාගැනීම සඳහා වැඩමුළු නොපවත්වා ප්‍රශ්න පත්‍ර පිළියෙල කර තිබුණි.

(ආ) මූලාකෘති ප්‍රශ්න පිළිබඳ සිංහල හා දෙමළ මාධ්‍ය පිටපත් 6,148 ක් කළාප අධ්‍යක්ෂවරුන් 98 ක් මගින් පාසල් 6,148 ක් වෙත බෙදාහැරීමට සැලසුම් කර තිබුණද, එම පොත් ලබාගත් බවට කළාප 27 කට අයත් පාසල් 1996 ක විදුහල්පතිවරුන් විසින් සනාථ කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ආයතනික විභාග සඳහා ප්‍රශ්න පත්‍ර හා උත්තර ලියන කඩදාසි තැපැල් කාර්යාල මඟින් ශාලාධිපතිවරුන් වෙත බෙදාහරිනු ලබන අතර භෞතිකව කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) විභාග සංවිධානය, පැවැත්වීම සහ ලිපිද්‍රව්‍ය තැපැල්කිරීම යන කටයුතු අතර මනා සම්බන්ධීකරණයකින් තොරව කටයුතු කිරීම නිසා කල් දමනු ලබන විභාග වෙනුවෙන්ද ලිපිද්‍රව්‍ය තැපැල්කර යවා තිබුණි.

(ii) ගබඩාවට ආපසු ලැබෙන ආයතනික විභාග සඳහා භාවිතාකර ඉතිරි වූ විභාග ලිපිද්‍රව්‍ය ලේඛනගත කර නොතිබුණි.

**3.6 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 85 | 64 | 21 | - |
| (ii) | තෘතියික මට්ටම | 18 | 10 | 08 | - |
| (iii) | ද්විතියික මට්ටම | 415 | 325 | 90 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 164 | 156 | 08 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 28 | - | 28 |
| | **එකතුව** | **682** | **583** | **127** | **28** |